TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

366, Nawala Road, Nawala, Rajagiriya, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 865777
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org
Reg No. GA 279

2026.08.05

<u>මහජනයා වත්කම් - බැරකම් ප්‍රකාශන ප්‍රසිද්ධ අවකාශයේ භාවිත කිරීම අවහිර කිරීමට රජය සැරසේ !</u>

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත හරහා හඳුන්වා දුන් වඩාත්ම වැදගත් විනිවිදභාවය හා වගවීම ඇති කිරීම සඳහා ඉවහල් වන ප්‍රතිසංස්කරණවලින් එකක් වන, වත්කම් සහ බැරකම් ප්‍රකාශන වෙත මහජනයාට ඇති ප්‍රවේශය දුර්වල කෙරෙන යෝජිත සංශෝධන පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) ආයතනය රජයෙන් දැඩි ලෙස ඉල්ලා සිටියි.

තම වත්කම්-බැරකම් ප්‍රකාශ කිරීම මගින් මහජනයා වෙතින් බලය ලබා ගෙන ඇති තැනැත්තන් ස්වකීය වත්කම්, බැරකම් සහ මූල්‍යමය හිමිකම් හෙළිදරව් කිරීම අනිවාර්ය කර ඇත. හෙළිදරව් නොකළ වත්කම්, බැඳියාවන් අතර ගැටුම් සහ දූෂණයෙන් උපයාගත් වත්කම් සැඟවීමට එරෙහි ප්‍රධාන ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස මෙය ක්‍රියා කරයි. දූෂණ විරෝධී පනත යටතේ, මෙම වත්කම්-බැරකම් ප්‍රකාශන පරිපාලනය කිරීමේ සහ ඒවායේ සංස්කරණය කරන ලද (සංවේදී තොරතුරු වසන් කරන ලද) පිටපත් මහජනතාව වෙත ලබා දීමේ මධ්‍යම බලධාරියා ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) කටයුතු කරයි.

වත්කම්-බැරකම් ප්‍රකාශන මහජනතාවට ප්‍රසිද්ධියේ භාවිත කිරීමට අවකාශ ලබා දීම, ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී සටන් මගෙහි තැබූ දැවැන්ත ප්‍රගාමී පියවරකි. 'මහජනයාගේ බලය භාවිත කරන තැනැත්තන් මහජනතාවගේ අධීක්ෂණයට විවෘත විය යුතුය', යන මූලධර්මයට ප්‍රායෝගික අර්ථයක් ලබා දීමට එය සමත් විය. මෙම වත්කම් බැරකම් ප්‍රකාශනවලට අර්ථවත් ප්‍රවේශයක් පැවතීම මගින් මාධ්‍යවේදීන්ට, සිවිල් සමාජයට, විද්වතුන්ට සහ පුරවැසියන්ට, අදාළ තැනැත්තන්ගේ වත්කම් හා බැරකම්වල පවතින පරස්පරතා හඳුනා ගැනීමටත්, ඇති විය හැකි බැඳියාවන් අතර ගැටුම් හෙළිදරව් කිරීමට හැකියාව ලැබේ. එමෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් ඔවුන්ගේ නීත්‍යානුකූල ආදායමෙන් පැහැදිලි කළ හැකිද යන්න පිළිබඳව ප්‍රශ්න කිරීමටත් හැකියාව ලැබේ. මෙවන් මහජන අධීක්ෂණයකින් තොරව, වත්කම් - බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සඳහා ක්‍රියාපටිපාටියක් පවත්වා ගෙන යාම වනාහි, වගවීම සඳහා වන සළුලදායී මෙවලමක් පවත්වා ගන්නවා වෙනුවට, හුදු නාමමාත්‍රික පරිපාලනමය මෙවලමක් නඩත්තු කිරීමක් පමණි.

2026 ජූලි 24 වන දින ගැසට් පත්‍රයේ පළ කරන ලද දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත මගින් මෙම ප්‍රතිසංස්කරණය ආපසු හැරවීමට ලක් කර ඇත.

වඩාත්ම බැරෑරුම් කරුණ වන්නේ, පනත මගින්ම මහජනතාව වෙත විවෘතව ලබා දී ඇති තොරතුරු, මහජනයා විසින් භාවිත කිරීම මෙම පනත් කෙටුම්පත මගින් අපරාධ වරදක් කිරීමයි. කෙටුම්පතට අනුව වත්කම්-බැරකම් ප්‍රකාශනයක් භාවිත කිරීම පනතෙහි නිශ්චිතව දක්වා ඇති ආයතනයකට හෝ නිලධාරියෙකුට ඉදිරිපත් කිරීමට පමණක් සීමා කර ඇති අතර, ඒ මගින් මහජන අධීක්ෂණය,

ආණ්ඩුකරණයේ වගවීම සහතික කිරීම සහ දැනුවත් මහජන කතිකාවතකට ඉඩකඩ සලසන මෙවලමක ඇති අර්ථසහගත බව හා අරමුණ අහෝසි කර දමයි.

නීත්‍යානුකූලව මහජනතාව වෙත විවෘත කර ඇති තොරතුරු භාවිත කිරීම අපරාධයක් බවට පත්කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ප්‍රකාශනයේ නිදහස බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි. එමෙන්ම, සැඟවූ වත්කම්, බැඳියාවන් අතර ගැටුම් සහ ධුරයන් අවභාවිත කිරීම් හෙළිදරව් කරගත හැකි සමස්ත මහජනයාගේ සක්‍රීය නිරීක්ෂණය හා විමසිලිමත්භාවයම අධෛර්යමත් කිරීමටද මෙය හේතු වනු ඇත.

තවද, පැහැදිලි නිර්ණායක පැනවීමකින් තොරව, පෞද්ගලිකත්වයට හානි වන බවට සලකනු ලබන ඕනෑම තොරතුරක් සංස්කරණය කිරීමට (වසන් කිරීමට) ඇති පුළුල් බලය මෙම පනත් කෙටුම්පත මගින් මධ්‍යම බලධාරියා වන අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිශන් සභාවට පැවරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අර්ථවත් මහජන අධීක්ෂණයකට අත්‍යවශ්‍ය වන තොරතුරු පවා මහජනතාවගෙන් සඟවා තබා ගැනීමේ බරපතල අවදානමක් නිර්මාණය වේ. මහජන බලය භාවිත කරන තැනැත්තන්ගේ මූල්‍යමය හිමිකම් පිළිබඳව සාධාරණ ලෙස තක්සේරු කිරීමට මහජනතාවට නොහැකි වන පරිදි මෙම ප්‍රකාශනයන්හි සංවේදී තොරතුරු අධික ලෙස ඉවත් කරන්නේ නම්, එවැනි මහජන ප්‍රවේශයකින් ඇති සඵලදායීබව අවමය.

මෙයට අමතරව වත්මන් දූෂණ විරෝධී පනතට අනුව වත්කම් - බැරකම් ප්‍රකාශකයා සමඟ අවම වශයෙන් මාස හයක්වත් එකට ජීවත් වූ තැනැත්තෙකුගේ වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාව මෙම පනත් කෙටුම්පත මගින් ඉවත් කරනු ලබයි. යම් රාජ්‍ය නිලධාරියෙක් අදාළ වත්කම් පාලනය කිරීම, භාවිත කිරීම හෝ ඒවායින් ප්‍රතිලාභ ලැබීම සිදුකරන අතරතුර, එම වත්කම්, අදාළ නිලධාරියා සමග වෙසෙන සහකරුවෙකුගේ හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමට පැවරීමේ හැකියාව පවතී. මෙම තොරතුරු ඉවත් කිරීම මගින් වත්කම් සැඟවීම සඳහා පැහැදිලි මාර්ගයක් විවර වන අතර, ප්‍රකාශනවල නිරවද්‍යතාව තහවුරු කිරීමටත්, සැබෑ ප්‍රතිලාභී හිමිකාරිත්වය හඳුනා ගැනීමටත්, නීත්‍යානුකූල නොවන හෝ නුසුදුසු ලෙස උපයාගත් වත්කම් සොයා ගැනීමටත් බලධාරීන්ට මෙන්ම මහජනතාවට ඇති හැකියාව තවත් දුෂ්කර කරනු ලබයි.

දූෂණයට එරෙහිව සටන් කිරීම, විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කිරීමේ පැහැදිලි ප්‍රතිපත්ති ප්‍රකාශනයක් පෙරදැරිව වත්මන් රජය බලයට පත්වූ පසුබිමක, මෙම සංශෝධන ගෙන ඒම වඩාත් කණගාටුදායකය. විශේෂයෙන්ම දූෂණයට රජකම් කිරීමට ඉඩ සලසන රහස්‍යභාවය සහ නීතියේ පවතින හිඩැස් අහෝසි කිරීම උදෙසාම වත්මන් රජය වෙත අදාළ මහජන වරම හිමි විය.

වත්කම් - බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ රාමුව දුර්වල කිරීම එම මහජන වරම සෘජුවම උල්ලංඝනය කිරීමකි. දූෂණ විරෝධී පොරොන්දු මත බලයට පත් වූ රජයකට, වත්කම් සැඟවීම පහසු කිරීමටත්, මහජන නිලධාරීන්ගේ වත්කම් පරීක්ෂා කිරීම වඩාත් දුෂ්කර කිරීමටත්, ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු භාවිත කිරීමේ අයිතිය ඇති පුරවැසියන් බන්ධනාගාරගත වීමේ අවදානමකට ලක් කිරීමටත් දැන් කටයුතු කළ නොහැකි වෙනු ඇත.

එබැවින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) ආයතනය රජයෙන් ඉල්ලා සිටින්නේ:

- වත්කම් - බැරකම් ප්‍රකාශනය නීත්‍යනුකූල මහජන හිතකාමී භාවිතය සම්බන්ධයෙන් පැනවීමට යෝජිත සීමා සහ අපරාධමය වරද ඉවත් කරන ලෙසත්;
- වත්කම් - බැරකම් ප්‍රකාශකයා සමඟ එකට ජීවත් වන සහ අන්‍යෝන්‍ය අයිතිවාසිකම් හා වගකීම් බෙදා හදා ගන්නා තැනැත්තන්ගේ පෞද්ගලික තොරතුරු මහජනයාට හෙළිදරව් වීමෙන් ආරක්ෂා කරන අතරම, ඔවුන්ට අදාළ තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාව ඒ ආකාරයෙන්ම පවත්වා ගන්නා ලෙසත්; සහ
- රඳවා තබා ගත යුතු තොරතුරු මොනවාදැයි තීරණය කිරීමට මධ්‍යම බලධාරියා වෙත පුළුල් බලයක් පැවරීම වෙනුවට, සංස්කරණය කළ හැකි (වසන් කළ හැකි) තොරතුරු මොනවාද යන්න නීතියෙන් පැහැදිලිව සහ පටු ලෙස නිර්වචනය කරන ලෙසත්ය.

මහජනයාගේ බලය දරන්නෝ මහජන විශ්වාසය පිළිබඳ පරමාධිපත්‍ය නීති මූලධර්මය යටතේ සිය බලය භාවිත කිරීම වෙනුවෙන්, ඉහළ මට්ටමේ මහජන අධීක්ෂණයකට යටත් වීමට එකඟ වන සමාජ සම්මුතියකට බැඳී සිටිති. ඒ අනුව, මහජන නිලධාරීන් මහජන නිරීක්ෂණයට යටත් කිරීම සඳහා පැහැදිලි වූත්, ස්ථාපිත වූත් පදනමක් පවතී.

අපහාස කිරීම, හිරිහැර කිරීම සහ ඊට අදාළ වන වෙනත් වැරදි සම්බන්ධයෙන් දැනට පවතින නීති මගින් තොරතුරු අවභාවිතය හෝ අයථා භාවිතය වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දැනටමත් සපයා ඇත. එබැවින්, නීත්‍යනුකූලව ප්‍රසිද්ධියට පත් කර ඇති තොරතුරු අභිමත පරිදි භාවිත කිරීම මත පුළුල් සීමා පැනවීම සඳහා කිසිදු සාධාරණීකරණයක් නොමැත. තොරතුරු දැනගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පිළිගෙන ඇති අතර, එබැවින් සියලුම නීති සහ ආණ්ඩුකරණ රාමුව මගින් එම අයිතිය දුර්වල කිරීම හෝ සීමා කිරීම වෙනුවට, එය සඵලදායී ලෙස බලගැන්වීම සිදු කළ යුතුය.

2023 වසරේදී දූෂණ විරෝධී පනත යටතේ අත්කර ගත් ප්‍රගතිය ආරක්ෂා කිරීමටත්, ගෙන එනු ලබන ඕනෑම සංශෝධනයක් මගින් බලයේ සිටින තැනැත්තන් වගකීමට ලක් කිරීමට මහජනතාවට ඇති හැකියාව දුර්වල කිරීම වෙනුවට එය තවදුරටත් ශක්තිමත් කිරීමටත් රජය, පාර්ලිමේන්තුව සහ අදාළ රාජ්‍ය ආයතන කටයුතු කළ යුතුය. වත්කම් ප්‍රකාශනයන් සඵලදායී වන්නේ ඒවා මගින් අර්ථවත් තොරතුරු හෙළිදරව් කරන්නේ නම් සහ එම තොරතුරු පරිශීලනය කර නිරීක්ෂණය කිරීමට මහජනතාවට නිදහස තිබේ නම් පමණි. ඊට අඩු ඕනෑම පියවරක් මගින්, මහත් වෙහෙසක් දරා අත්කර ගත් මෙම වගවීමේ ප්‍රතිසංස්කරණය හුදු ඵලක් නැති ක්‍රියාවලියක් බවට පත් කරනු ලබයි.